# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

## (අධිකරණ අමාත්‍යාංශය)

**2015 අංක 05 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අධ්‍යක්ෂ (රකවරණ) තනතුර සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ (රකවරණ) HM 1-3 (තනතුරු 01)

**රැකියා සාරාංශය :**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවන ලද 2015 අංක 04 දරණ පනතේ (VI) වන කොටස ප්‍රකාරව, අපරාධයක වින්දිතයෙකුට සහ සාක්ෂිකරුවෙකුට ආරක්ෂාව සැපයීමට අදාළ රාජකාරී පැවරෙන අතර රකවරණ අංශයේ ප්‍රධානියා ලෙස රාජකාරී වගකීම් හා කාර්යයන් ඉටු කිරීම මෙම තනතුරේ වගකීම් අතරට ගැනේ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන්:**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, අපරාධවේදය (Criminology) හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්හි විශේෂ උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාළ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "විධායක / මධ්‍යම කළමනාකරණ මට්ටමේ" විෂයය ක්ෂේත්‍රයට අදාළ තනතුරු වල අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමඟ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත සඳහන් 01 හෝ 02)**

01. මෙම තනතුර සඳහා වන ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. කළමනාකාර සේවා (MM) ගණයෙහි 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :**

HM 1-3 රු. 86,865-15x2,270 – 120,915

**<u>කොන්දේසි</u>**

01. වයස් සීමාව :

අවු:35ට නොඅඩු හා අවු:55ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

02. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ලැබූවන් අතුරින් අවම වශයෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ:-

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | - | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අනෙකුත් අදාළ කාර්යය සාධනයන් හා කුසලතා | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී කාර්ය සාධනය | - | <u>ලකුණු 25</u> |
| **මුළු ලකුණු ගණන** | - | **<u>ලකුණු 100</u>** |

03. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

04. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතු අතර ඔහු හෝ ඇය තනතුර සඳහා තෝරා ගතහොත් නිදහස් කරන බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

05. දැන්වීමට අනුව මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික පත්වල අයදුම්කරු විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතුය.

07. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක වනු ඇත.

08. මෙම තනතුර සඳහා රජයේ අනුමත දීමනා සහ තනතුරට හිමි වරප්‍රසාද හිමිවේ.

09. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.

10. අයදුම්පත් කැඳවීම අවසන් දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ජීව දත්ත සටහනක් හා සහතික පත්‍රවල ඡායා පිටපත් සමඟ, "**අධ්‍යක්ෂ ජනරාල්, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය, 428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**" යන ලිපිනයට **2021.05.10** දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්**

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**

**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**දු. අංක. 0112879539**

**දිනය : 2021.04.25**